# 1948-1974 දක්වා සිංහල පුවත්පත් භාෂාවේ විකාශය.

1978 ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණයේ කොටසක් වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන නිබන්ධයයි.

122791

එල්.ඩී.සිල්වා

ඒ. 9684

## පෙරවදන

මෙම පර්යේෂණ කෘතියේ දී ඉතා කාරුණිකව ක්‍රියා කළ, මාගේ උපදේශකවරුන් වූ මහාචාර්ය විමල් ජී. බලගල්ලේ, ආචාර්ය තිස්ස කාරියවසම් යන මහතුන්ද, අවශ්‍ය අවස්ථාවන්හිදී කරුණු වටහා දුන් ආචාර්ය ටී. බී. කන්ගහආරච්චි ආචාර්ය නන්දසේන, රත්නපාල ආචාර්ය ආර්. විජේතුංග හා පුවත්පත් කලාවේදී එඩ්වින් ආරියදාස යන මහතුන්ද දුර්ලභ පොත් කිපයක්ම සපයා දෙමින් උපකාර කළ, ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමයේ ඩබ්: කත්දගේ හා පියසෝම මේදිස් යන මහතුන්ද, පුවත්පත් පරිශීලනයට පහසුකම් සැපයූ, ලංකා ජාතික රාජ්‍ය ලේඛනාගාරයේ කාර්ය මණ්ඩලයද ග්‍රන්ථ පරිශීලනයට පහසුකම් සැපයූ විද්‍යෝදය, විද්‍යාලංකාර හා කොළඹ මණ්ඩපවල පුස්තකාලයන්හි කාර්ය මණ්ඩලද, අත් පිටපත කියවූ හේමා නංගීද, යතුරුලියනය කර දීමෙන් සහාය වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්. ලියනගේ මහතාද, ඉතාමත්ම ඕනෑකමින් මා මෙම කාර්යයෙහිලා උනන්දු කරමින්, නන් අයුරින් උපකාර කළ, කොරළවැල්ල ශ්‍රී නාගසේන විදුහලේ විදුහල්පතිනී, රූපා, සිල්වා ශිසායුරියද මා ආදර ධර්මේද, නම් වශයෙන් මෙහි සඳහන් නොකළත් මෙම පර්යේෂණයට අත හිත දුන් සියල්ලන්ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

එල්. ඩී. සිල්වා

කොද/ශ්‍රී සුනන්දෝපනන්ද මහ විදුහල

එගොඩඋයන

මොරටුව.

## හැ ඳි න් වී ම

### 1948 - 1974 දක්වා සිංහල පුවත්පත් භාෂාවේ විකාශය.

යටත් විජිත යුගයේ දී රාජ්‍ය භාෂාව ඉංග්‍රීසිය වූ නිසා , සිංහල භාෂාව ලේඛනවල ව්‍යවහාර වූයේ මඳ වශයෙනි. පුවත්පත් ආරම්භ වී ශතවර්ෂයක් පමණ ගත වූ පසුව, නවීන භාෂා උනන්දුව සමග සිංහල පුවත්පත් භාෂාවේ වැඩීමක් විසිවන සිය වසේ සිව්වන දශකය හරියේදී ආරම්භ විය. අළුත් ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී ද, විග්‍රහයේ දී ද, සාහිත්‍ය කෘතිවල එන භාෂාවට වඩා වෙනස් පුවත්පත් භාෂාවක් හැඩ ගැසෙන්නට විය. මුල් දශකවල කෙටිකතා, කවි, ගීත ආදියෙහි එන සාහිත්‍යමය භාෂාවට වඩා වෙනස් ලක්‍ෂණ ඇති භාෂාවක්, නිර්මාණ සාහිත්‍යය සම්බන්ධයෙන් ද ක්‍රියාත්මක වූ බව පෙනේ. එහෙයින් 1948 - 1974 දක්වා මෙකී පුවත්පත් භාෂාවේ වැඩීම පිළිබඳව විග්‍රහයක් කිරීම මෙම නිබන්ධනයෙන් අපේක්‍ෂා කෙරේ.

මේ යුගයේ බිහිවූ පුවත්පත් විවිධ පරමාර්ථ රැසක් ඉෂ්ට කර ගැනීම සඳහා මුද්‍රණය වූ හෙයින් භාෂාව සම්බන්ධයෙන් විමසන විටද, සෑහෙන විවිධත්වයක් තිබෙන බව කිව හැක. සාමාන්‍ය පුවත්පත්, බෞද්ධාගමික පුවත්පත්, අන්‍යාගමික පුවත් පත්, දේශපාලනික පුවත්පත් හා වෙනත් යම්කිසි අරමුණු නිසා හතු පිපෙන්නාක් මෙන් පැන නැගුණ සමහර පුවත් පත් යන මේ එක් එක් අංශයෙහි පරමාර්ථ සාධනය කරගනු වස්, උපයුක්ත භාෂාවේ පෙනෙන, වෙනස්කම්, මෙහිදී විග්‍රහයට භාජනය වේ.

පරිච්ඡේද

1. ජන සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් පුවත්පතේ වැදගත්කම

2. 1. පුවත, පුවත්පත හා එහි ආරම්භය

   11. පුවත්පත ඇතුළු මුද්‍රිත ජනමාධ්‍යවල විකාශය

3. 1948 දක්වා සමකාලීන සාහිත්‍යමය භාෂාව හා පුවත්පත් භාෂාව අතර ඇති සම්බන්ධය

4. පුවත්පත කෙරෙහි භාෂා මාධ්‍යයේ බලපෑම

    1. මුල්කාලයේ සිංහල පුවත්පත හා බස
    11. වර්තමාන සිංහල පුවත්පත හා බස
    111. පුවත්පතක වාර්තාකරණය

5. පුවත්පත් දැන්වීම්

    1. පුවත්පත් දැන්වීම් භාෂාව
    11. මුල්කාලයේ පුවත්පත් දැන්වීම් භාෂාව හා වත්මන් පුවත් පත් දැන්වීම් භාෂාවේ වෙනස්කම්.

6. පුවත්පත් භාෂාවේ විකාශය

    1. කතුවැකි භාෂාවේ විකාශය
    11. විශේෂාංග රචනා භාෂාවේ විකාශය.

## 1 වන පරිච්ඡේදය

## ජන සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් පුවත්පතේ වැදගත්කම.

තමා තුළ ඇති අදහස්, නැතහොත් ප්‍රවෘත්ති ජනතාවට දැන්වීමය, ජන සන්නිවේදනයෙන් කෙරෙන්නේ. කූව, දුම, සවිකිම, කලා පිඹීම ආදි සරල ක්‍රම වලින් පටන් ගත් සන්නිවේදනය, විද්‍යාවේ දියුණුවත් සමගම අද ඉතා සංකීර්ණ තත්වයට පත්වී ඇත.[1] සන්නිවේදකයෝ, සන්නිවේදනය යන්න විවිධ ලෙස විග්‍රහ කරති. සමාජ විද්‍යාඥයෝ, මිනිස් සමාජයේ අන්තර් ක්‍රියාවලින් හැඳින්වීමට සන්නිවේදනය යන්න භාවිත කළහ. එමෙන්ම තවත් සමහරු, මිනිසා ගේ ජීවිතයට බල පෑ ක්‍රියාවලින් හැඳින්වීමට සන්නිවේදනය යන්න භාවිත කළහ. එමනිසා සන්නිවේදනය යන්න ප්‍රවෘත්ති, තොරතුරු, අධ්‍යාපනය, විනෝදය සංස්කෘතිය හා ප්‍රචාරය යන අංශයන් සමග මිශ්‍රව භාවිත වන්නට විය. පුළුල් වශයෙන් ගතහොත්, සන්නිවේදනය, අපේ අත්දැකීම්, තොරතුරු අදහස්, ආකල්ප ආදිය පිළිබඳ හුවමාරුවක් ලෙස හඳුන්වන හැක. මෙය මිනිස් දිවියේ ආරම්භයේ සිට අවසානය දක්වා නොකඩවාම සිදුවන ක්‍රියාවලියකි. විශාල ජනසමූහයා සමග අදහස් හුවමාරු කිරීම සඳහා පුවත්පත, ගුවන් විදුලිය, රූපවාහිනිය වැනි ජනමාධ්‍ය භාවිතා කිරීම ජන සන්නිවේදනය යනුවෙන් හැඳින්වේ.

ජන සන්නිවේදන කලාව දුෂ්කර විෂයක් වන්නේ, එකිනෙකාට ආමන්ත්‍රණය කරනවාට වඩා, විශාල ජන කොට්ඨාශයකට ආමන්ත්‍රණය කිරීම අපහසු බැවිනි. විවිධ මතධාරී පුද්ගලයන් අතර හොඳ සන්නිවේදකයකු විය හැක්කේ, එම ශ්‍රාවකයන් අතුරින් බොහෝ දෙනා තමන්ගේ බසට එකඟ කර ගත හැකි අන්දමින් සිය නිවේදනයන් කිරීමය. බුදුන් වහන්සේ, ජේසුස් වහන්සේ, මහම්මත් තුමා, කාල්මාක්ස්, ලෙනින් හා කොන්ෆියුසියස් වැනි අය ලෝක ඉතිහාසයේ ඉතාමත් ශ්‍රේෂ්ඨ සන්නිවේදකයන් ගේ

---

1. කාරියවසම්, තිස්ස. - ජනසන්නිවේද ප්‍රවේශය, පදීප ප්‍රකාශකයෝ, කොළඹ, 1974. (38 පිට.)

ගණයට වැටේ.

ජනමාධ්‍යයන් ලෝකයේ ව්‍යාප්ත වීමට ප්‍රධාන හේතුවක් වූයේ මිනිසාට අවශ්‍ය වන තොරතුරු, පණිවිඩ ඉදිරිපත් කිරීම නිසාය. වර්තමාන ලෝකයේ ජීවත්වන කිසිම කෙනෙකුට පුවත්පත් හෝ ගුවන් විදුලිය වැනි ජනමාධ්‍යයකින් තොරව ජීවත්වීම ඉතා අපහසු වී ඇත. ඒවා මනුෂ්‍ය ජීවිතයට අත්‍යවශ්‍ය අංශයන් බවට පත් වී අවසානය. එතරම් ප්‍රබලතාවක් ජනමාධ්‍යයන් තුළ දක්නට ඇත.

ජන සංස්කෘතිය පෝෂණය කරන, විශේෂයෙන් සංස්කෘතිය ජනතාව අතරට ගෙන එන, මාධ්‍යයක් වශයෙන් පුවත්පත සැලකේ. ආහාර පාන, ඇඳුම් පැළඳුම් හා වාසස්ථාන මෙන්ම සන්නිවේදනයද මිනිස් දිවිය හා ඉතා කිට්ටුව පවතී. මිනිසා එකිනෙකා සමඟ සිය අදහස්, දැනුම්, දක්ෂතා හා අත්දැකීම් හුවමාරු කර ගැනීම මිනිස් සමාජයේ කැපී පෙනෙන ලක්ෂණයකි. භාෂාවක් නොවූ මුල් කාලයේ මිනිසා, ඔහුගේ අදහස්, හැඟීම්, අත්දැකීම්, ප්‍රකාශ කරන ලද්දේ ශබ්ද, සළකුණු හා සංඥා ආදිය මාර්ගයෙනි. මෙසේ ඇරඹුණු අදහස් හුවමාරුව, අද නවීනතම විද්‍යාත්මක සන්නිවේදන ක්‍රම වලින් කරනු ලබයි.

ආචාර්ය විල්බර් ශ්‍රාම් නම් සන්නිවේදන විශාරදයා පවසන පරිදි වනචාරී මානව සමාජයන්හි සිය වර්ගීය ආරක්ෂා කිරීම සඳහාත් පිටතින් පැමිණෙන උවදුරු දැන්වීම සඳහාත් උස් කණුවකට වී මුර දෙටුවකු සිටින්ට ඇත. එමෙන්ම සමහර විටක, එම වර්ගයේ වැඩිමහලුන් විසින් ගෝත්‍රික සිරිත් විරිත් තම දරුවන්ට කියා දෙන්නට ඇත. මව්වරුන් විසින් සිය දියණියන්ට උයන පිහන සැටි, පුතුන්ට දඩ කෙළියේ යෙදෙන සැටිත්, සතුරන් හා සටන් කරන අයුරුත් කියා දෙන්නට ඇත. මේවා හැමයක්ම වාගේ එම ගෝත්‍රිකයන්ගේ පැවැත්මට අවශ්‍ය වූ ප්‍රධාන සන්නිවේදන විධි වන්ට ඇත.[2] මේ වායින් වැටහෙන්නේ, පළමු කොටම මානව සංහතියේ පැවැත්ම

---

2. Schramm, Wilber, The Science of Human Communication, New york, 1963, (PP. 14).

පුස්තකාලය

සඳහා සන්නිවේදන කාර්යයන් අවශ්‍ය වූ බවයි.[3]

සන්නිවේදනයේ පුළුල් වූත්, සංකීර්ණ වූත් සංවිධානයක අද අප සිටින නිසා, පෙර තිබූ ස්වරූපය ක්‍රමක්‍රමයෙන් වෙනස් වී, සන්නිවේදනය පොදු දෙයක් බවට පත්ව ඇත. එදා මුහුණට මුහුණ ලා කළ පරිමිත සන්නිවේදනය අද කිසියම් මාධ්‍යයක් භාවිත කොට කරන ජනසන්නිවේදනයක ස්වරූපයෙන් ක්‍රියාත්මක කරනු දක්නට ලැබේ.

පොදු මාධ්‍යයක් භාවිත කිරීම නිසා, පුවත්පත, ගුවන්විදුලිය, සිනමාව ආදි ජනමාධ්‍යයන් ක්‍රමයෙන් වැඩි ආ අයුරු අපට පෙනේ. පුරාණ මිනිසුන්ට තම හැඟීම්, අන්‍යයන් හට ප්‍රකාශ කිරීම එතරම් අපහසු නොවූයේ, ඔවුන් කුඩා සමූහයක් වශයෙන් සිටි හෙයිනි. මේවා වෙනස් වී විශාල සමාජ කොටස් බවට විකාශනය වීමේ දී සන්නිවේදනය පැතිරීමක් ද අවශ්‍ය විය.

සන්නිවේදන පද්ධතියක් වඩා හොඳ ගොඩ නැගී ඇති සමාජයක, පැවැත්මට ප්‍රවෘත්ති අත්‍යවශ්‍ය වේ. යුරෝපයේ ඇතිවූ කාර්මික විප්ලවය සමගම, ප්‍රවෘත්ති හුවමාරු කිරීම, සමුදුරටත් ඉදිරියට ගියේය. පුද්ගලයාගෙන් පුද්ගලයාට ප්‍රවෘත්ති පැතිර යාම වෙනුවට, සමූහයක් අතර බහුල ලෙස ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමට හැකි විය. එමගින් ජනතාවට පොදු පණිවිඩ ක්‍රමයක් පාවිච්චි කිරීමේ හැකියාව ද ඇති විය.

ආර්ථික හේතූන් අනුව, ගුවන් විදුලිය, චිත්‍රපට, රූපවාහිනිය යන ජනසන්නිවේදන මාධ්‍යයන් බොහෝ සෙයින් බලපාන්නේ මධ්‍යම පන්තික ජීවිතයට පමණි. එසේ වුවත් පුවත්පත, නිෂ්පාදනය කිරීමේ දී, කාර්මික අතින් ලබා ඇති දියුණුව නිසාත්, ආර්ථික හේතූ නිසාත්, එය පාරිභෝගිකයා අතට පහසුවෙන් ළඟාකර ගැනීමට පුළුවන් වී ඇත.

---

3. ද මැල්, සුනන්ද මහේන්ද්‍ර. - සන්නිවේදන කෝෂය හා ජන සන්නිවේදනය, එම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1977. (6,7 පිටු)

අවට පරිසරය ගැන මනුෂ්‍යයා තුළ පවතින කුතුහලය ස්වාභාවික ගුණයකි. මෙම කුතුහලය, තොරතුරු ඇසීමේ හා කියවීමේ උපත ලෙස සැලකිය හැක. මෙබඳු සමාජ අවශ්‍යතාවන් නිසා පුවත්පත බිහි විය. ක්‍රමයෙන්, පවුල, ගම, නගරය රට යන සංස්ථා මනාව එකිනෙකට සම්බන්ධ වීම නිසා, එබඳු සමාජ ක්‍රමයක ජීවත්වන මිනිසුන්ට සිය අදහස් හුවමාරු කර ගැනීම සඳහා පුරාණ ග්‍රීසියේ ඇතැන්ස් නුවරට එකතුවී, අදහස් හුවමාරු කරගත් පැරණි ක්‍රමය ප්‍රමාණවත් නොවීය. අධ්‍යනය හා ළමවන්ට අදහස් පවත්වා ගෙන යාමට ක්‍රමයක් අවශ්‍ය වූ හෙයින් පුවත්පත බිහි විය.[4]

එදිනෙදා ප්‍රවෘත්ති මගින් විවිධාකාරයෙන් දැනුම ලබාදීම සඳහා පමණක් නොව විවේකය ගත කිරීමේ මාධ්‍යයක් වශයෙන්ද, පුවත්පත වැදගත් වේ. විද්‍යාවේ දියුණුවත් සමගම පුවත්පත වඩාත් ප්‍රචලිත වීම නිසා, අද ගැමි සමාජ වලද, මිනිස් සිත් සතන් වෙනස් කිරීමේ මාධ්‍යයක් වශයෙන් පුවත්පතට වැදගත් තැනක් හිමි වේ. පුවත්පතක් මිලදී ගැනීමට අපහසු, ආර්ථික දුෂ්කරතාවන් ගෙන් පෙළෙන අය, පුස්තකාලය, ආපනශාලා හෝ එබඳු වෙනත් පොදු මධ්‍යස්ථාන කරා ගොස් පුවත්පත් බැලීමට පුරුදු වී සිටිති. එමෙන්ම අකුරු නොදත් අය පවා කියවීමට දන්නා අයගෙන් රටේ තොටේ තොරතුරු විචාරනු පෙනේ.

පුවත්පත සමාජයේ, සංකලිත භාවය ආරක්ෂාකර ගන්නා එකකි?, සමාජයේ, ආර්ථිකමයේ හා දේශපාලන ව්‍යුහයේ බලපවත්නා අසමාන සම බවට පත්කරමින් ඒවා අතර සම්බන්ධ අන්‍යෝන්‍ය සබැඳියාවන් ඇති කිරීමටද එය හැත් කරයි. විශේෂයෙන් දේශපාලන අංශය ගැන විමසීමේදී, පාලක හා පාලිත යන දෙපක්ෂය අතර පවත්නා සම්බන්ධය මෙන්ම, පාලක පක්ෂය යම් අත්තනෝමතික ස්වරූපයක් අනුගමනය කරන්නේ නම්, එය සීමා කිරීමේ වගාවරණයක් යොදා ගැනීමේ බලයක්ද පුවත්පතට ඇත. රජයක

---

4. Schramm Willber,(Mass Media and National Develonpent)
The rule of information in the devoloping countries
Stanford:Stanford UniversityParis, 1964.(PP 78 -92)

කටයුතු පිළිබඳ තොරතුරු දැනගන්නට මහජනයාට අයිතියක් තිබේ. එම අයිතිය භුක්ති විඳීමට මහජනයාට නොඅඩුව අවස්ථාව සලසා දීම පුවත්පතක කාර්යයක් වේ. එසේම පුවත්පතක් සමාජයේ අදහස් පිළිබිඹු කළ යුතු අතර, එසේ කිරීමේදී සමාජ සදාචාරය වත්, ගුණධර්ම වලටවත් හානි වන අයුරින් කටයුතු නොකළ යුතුය. මිනිසුන් සිටින තැනින් තවත් පහළට ඇද දැමීමට නොව, එතැනින් ඉහළට නැංවීමට උපකාර වන පරිද්දෙන් කටයුතු කිරීම පුවත්පතට අයත් කාර්යයකි. [5]

නිදහස් ලෙස අදහස් පළකිරීමට ඇති විවිධ මාධ්‍යයන් අතර, නූතන යුගයේ ඉතා වැදගත් වන්නේ පුවත්පතයි. මහජන අභිමතය මනාලෙස ප්‍රකාශ වන්නට නම්, පුවත්පතේ නිදහසද අත්‍යවශ්‍ය වේ. ප්‍රජාතන්ත්‍රවාදය මිනිසාගේ පෞද්ගලික පෞරුෂයේ අගය විශ්වාස කරයි. අනුන්ගේ මතයට ගරු කිරීම, අනුන්ගේ කීම්වලට ඇහුම්කන් දීම, අනුන්ගේ අදහස් සැලකිල්ලට ගැනීම මේ අතින් වැදගත් වේ. අනුන්ගේ මතවලට ගරු කිරීමට නම් ඒවා සැලකිල්ලට ගැනීමට නම්, නිදහස් ලෙස අදහස් ප්‍රකාශ කිරීමට ඉඩක් තිබිය යුතුය. ප්‍රකාශනයේ නිදහස තිබිය යුතුය. ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම හැටියට සැලකෙන්නේ ප්‍රබුද්ධ මහජන මතයයි. ප්‍රබුද්ධ මහජන මතය යනු හොඳින් තොරතුරු අසා, තොරතුරු කියවා, මනා ලෙස පෝෂණය වූ මතයයි. එවැනි පෝෂණයක් ඇති කළ හැක්කේ නිදහස් ලෙස අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ඇති තැන ය. පුවත්පත් නිදහස, මේ නිදහස් ප්‍රකාශනයේ වැදගත් අංගයකි.

මහජන මතය යනු නිකම්ම මතයක් නොවේ. එය ප්‍රාමාණික මතයක් විය යුතුය. ප්‍රාමාණික මතය ප්‍රධාන වශයෙන් දැනුමත්, විචාරයත් ආත්ම කොට ඇති මතයයි. දැනුම සඳහාත්, විචාරය සඳහාත් තොරතුරු උවමනාය. සපයා ගන්නා තොරතුරු නිවැරදි විය යුතුය. නිවැරදි තොරතුරු දැන ගන්නට නම් පුවත්පත් නිදහසද

---

5. Schramm, Wilber. The Science of Human Communication, New York. Basic Books 1963. (PP 3-25)

Basic

අවශ්‍ය වේ. ප්‍රකාශනයේ නිදහසද මූලික නිදහසකි. පුවත්පත් නිදහස, ප්‍රකාශනයේ නිදහසට ඇතුළත් වන්නේය. සමහර රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වල ප්‍රකාශනයේ නිදහස පැහැදිලිවම සඳහන් කොට ඇත.

මිනිසාගේ පුද්ගලයාට ඇති නිදහස පුවත්පතටද ඇත. එහි සාමාන්‍ය නීතිය උල්ලංඝනය නොකොට, ඕනෑම දෙයක් ප්‍රකාශ කරන්නටත්, පළකරන්නටත් පුවත්පත් වලට නිදහස ඇත. ප්‍රකාශනයේ නිදහස, ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් ද පිළිගෙන ඇත. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ද ප්‍රකාශනයේ නිදහස පිළිගෙන ඇත.

පුවත්පත් නිදහස යනු ඕනෑම දෙයක්, ඕනෑම විධියට ලිවිය හැකි, අවිචාරීව, මන්ද බුද්ධිකව හැසිරවීම් කළ හැකි නිදහසක් නොවේ. ඒ සඳහා යම් යම් සීමාවන් ඇත. රටේ ආරක්ෂාවට, මහජන ආරක්ෂාවට, රටේ සාම පැවැත්මට හානි වන අයුරින් යමක් පළ කිරීමට නොහැක. එසේම අසත්‍ය දෙයක් පළ කිරීම හිතිවෙලට අපහාස වන අයුරින් යමක් පළ කිරීම, මිනිසාගේ චරිතයද කැළැල් වන අයුරින් යමක් පළකිරීමටද නොහැක. පුවත්පත් කවුලුව සම්බන්ධයෙන් මේ සීමාවන් ඇත්තේ පොදු යහපත පිණිසය. අන්‍යයන්ගේ ආරක්ෂාව පිණිසය. ශිෂ්ට සම්මත ලෝකයා විසින් පිළිගෙන ඇති මෙම සීමාවන් ඉක්මවන්නේ නම්, එය පුවත්පතටත්, සමාජයටත් හානිකරය.

පොදු යහපත කුමක්දැයි තීරණය කර ගන්නටත්, පොදු යහපත සඳහා ලියන්නටත්, පොදු යහපතට හේතුවන, පොදු යහපත සැලසීමේ කාර්යයට උපකාර වන පුවත්, ලිපි, ඡායා රූප ආදිය පළකරන්නටත් පුවත්පත් වලට ඉඩ තිබිය යුතුය. නියමින් හෝ අනියමින් හෝ කිසිම බාධකයක් හෝ අවහිරයක් හෝ නොතිබිය යුතුය. බාහිර හා අභ්‍යන්තර බලපෑම් වලින් තොරවිය යුතුය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
පුස්තකාලය

බාහිර වශයෙන් බලපෑම් ඇති විය හැක්කේ ප්‍රධාන වශයෙන්ම ආණ්ඩු මගිනි. පුවත්පතක කටයුතු වලට ඇඟිලි ගසන්නට හෝ හඬ යටපත් කරන්නට හෝ, ඕනෑම රටක ආණ්ඩුවකට හැකියාවක්, ශක්තියක් ඇත. පුවත්පත් නිදහස සැබෑවක් බවට පත් කිරීමට නම්, ආණ්ඩු තමන්ගේ ඒ හැකියාවටත්, ශක්තියටත් සාධාරණ සීමාවක් ඇති කරගත යුතුය. එබඳු සීමාවක් ඇති කර ගත යුත්තේ නිදහස් අදහස් ප්‍රකාශනයත්, තොරතුරු දැනගැනීමත් ජනතාවගේ අයිතියක් වන නිසාය.

බාහිර වශයෙන් පොලිසිය, දේශපාලන පක්ෂයන් වෙළඳ අංශ දැන්වීම් පළකරන්නන් ආදී කොටස් වලින්ද, යම් යම් බලපෑම් ඇති විය හැක. පුවත්පතකට නිදහසේ කටයුතු කරන්නට නම් ඒවාද මග හරවා ගත යුතුව ඇත.

අභ්‍යන්තර වශයෙන් බලපෑම් ඇති විය හැක්කේ පුවත්පත් ආයතනයන් හි පාලක අංශයෙනි. පළකළ යුතුව ඇති පුවතකට හෝ ලිපියකට හෝ අදහසකට හෝ තමන් අකමැති විය හැක. එසේ නොවිය හැක. එසේ වුවත් එම අදහස් ඉවසා, ඊට සුදුසු පරිදි තැන් දීම, පුවත්පත් නිදහස පිළිබඳ සංකල්පයේ වැදගත් අංගයකි. ?

පුවත්පත් නිදහස පිළිබඳ සංකල්පයට චර්යාධර්ම හා සම්ප්‍රදාය ආදිය පිළිබඳ කාරණාත් ඇතුළත් වේ. පුවත්පත් කලාව හා සම්බන්ධව ආවේණික චර්යාධර්ම හා සම්ප්‍රදාය ඇත. පුවත්පතක කිසියම් ලියවිල්ලකට හෝ පුවෘත්තියකට තොරතුරු ලබාගත් ආධාරය කිසිම විටෙකත් හෙළි දරව් නොකිරීම පුවත්පත් කලාවේ ශ්‍රේෂ්ඨ සම්ප්‍රදායයකි. කරුණු හෝ තොරතුරු ලබාගත් ආධාරය හෙළිදරව් කරන්නට සිදුවන විට, දූෂණ, අක්‍රමිකතා, සොරකම්, වංචා ආදිය හෙළි නොව, සමාජයේ යහපත පිණිස කටයුතු කිරීම අසීරු වන්නේය. එපමණක් ද නොව, සාක්ෂි වූ වෙනත් පුවතක් ද පළකිරීම අසීරු වන්නේය. ඒ පිළිබඳ කිසිම තොරතුරක් සැපයීමට කිසිවකු ඉදිරිපත් නොවන බැවිනි.

පුවත්පතේ ක්‍රියා කලාපය දෙස බලන විට එය ජන සමාජයේ මුර බල්ලෙකුට සමාන කළ හැක. පුවත්පත් ඒකාධිකාරයන් තිබෙන රටක නම්, එය එතරම් දුරට සත්‍ය වේ දැයි කිව නොහැක. පුවත්පතට ආරූඪ වී ඇති නිදහස් චින්තනයේ ප්‍රමාණය අනුවය, ඉහත කී නිගමනයට බැසීමට හැකි වන්නේ. මුර සෙබලෙකුගේ තත්වය, පුවත්පත ගන්නා බව පෙනීමට නම්, මහජන චින්තනය පුවත්පතින් ගලා යන ස්වරූපයක් තිබිය යුතුය. යම් රටක පුවත්පතක්, එබඳු සේවයක් කරන්නේ නම්, එරට ජනතාව එම රටේ දේශපාලන ආර්ථික, සාමාජික හා ආගමික යන සංස්කෘතියේ සෑම අංශයකම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඒවා අගය කිරීම යන මට්ටම් තුනේදීම, ඒකාකාරව සම්බන්ධව ක්‍රියා කරන බව පුවත්පත දෙස බැලූ විට, පාඨකයාට එකවරටම හැඟී යා යුතුය. එමනිසාය බොහෝ දෙනෙකු කියන්නේ, පුවත්පත සමාජය නිරූපණය කරන කැඩපතක් කියා.[6]

තවත් අංශයකින් විමසා බලන විට, ජනසන්නිවේදකයකු වශයෙන් ද පුවත්පත වැදගත් වේ. දේශීය වශයෙන් හෝ විදේශීය වශයෙන් ප්‍රවෘත්ති ගෙන ඒම එහි වැදගත්ම ලක්ෂණයයි. සමාජ විද්‍යාත්මක අංශයෙන් බැලූ විටද පුවත්පතින් ඉතාම වැදගත් අංශ දෙකක් ඉටු වේ. එනම් සංස්කෘතිය පෝෂණය වීම හා, එම සංස්කෘතිය පරම්පරාවෙන් පරම්පරාවට පවත්වා ගෙන ඒමට ආධාර දීමද වේ. සාමාජික අංශයෙන් බලන විට වයස, උගත්කම, ධනය, ආදී වශයෙන් විවිධ වෙනස්කම් ඇති අයගේ අදහස් ද විවිධාකාර වේ. එම පරම්පරා ගැටුම තුනී කිරීමටද පුවත්පත ඉවහල් වේ.[7]

?

6. Berbo, David,K. - The process of Communication, New York, Holt,1960(PP 20-70)

7. Lerner,Daniel - The Policy Science ,Stenford: Stanford, 1965.(PP 51-88)

විශේෂ මතය ප්‍රකාශ කරන වේදිකාවක් වශයෙන් බොහෝ රටවල පුවත්පත සැලකේ. සන්නිවේදනය යන සංකල්පය යටතේ, ජාතික සංවර්ධන පණිවුඩය මහජනතාව අතරට ගෙන ගොස්, එය පැතිරවීමේ බලයක් පුවත්පතට ඇති බව ඇතැම් අය ප්‍රකාශ කරති. තුන්වන ලෝකයේ රටවල් සඳහා මෙය වැදගත්ය. ඇත්ත වශයෙන්ම එය පුවත්පතකින් සිදු විය යුතු ප්‍රධාන කාර්යයක් ද වේ.

දේශපාලනික අපක්ෂපාතී පුවත්පත් මෙන්ම, පාක්ෂික පුවත්පත් ද බෙහෙවින් පළ වනු දැකිය හැක. මේ හැම පුවත්පතකින්ම කරනු ලබන්නේ, ජනතාවට කිසියම් අවබෝධයක් ලබා දීමයි. රුචිකත්වය අනුව පුවත්පත් කියවීමට අද අවස්ථාව ලැබී තිබේ. ජනසන්නිවේදන මාධ්‍යයක් වශයෙන් පුවත්පත, විවිධ රුචිකත්වයන් ලබා දීමට උත්සාහ කර ඇත්තේ සංකීර්ණ සමාජයේ විවිධ අවශ්‍යතා සපුරා ලන අන්දමින්.

කිසියම් පුද්ගලයකුට හැකියාවක් ඇත්නම් පුවත්පත් මගින් අදහස් ප්‍රකාශ කළ හැක. තමන්ගේ දැනුම ඒ මගින් පුද්ගලයාට දියුණු කරගත හැක. පැරණි සමාජ වල පැවති හැකියාවන් ඒ තුළින් පෙන්වීමට අවස්ථාවක් නොලැබුණි. නවීන සමාජයේ පුවත්පත මිනිසුන්ගේ ජීවන රටාවේ එක් අංගයක් වී ඇතැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ.

ජාත්‍යන්තර ස්වරූපය ගැන බලන විට, අද කිසිම සමාජයකට තනිවම ජීවත්වීමට හැකියාවක් නැත. එහෙයින් රටවල් අතර හා ජනතාව අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය ඇති කිරීමටද පුවත්පත උපකාරී වේ. 'ප්‍රවෘත්ති සම්පාදනයේ හා ජන සන්නිවේදනයේ නව අන්තර් ජාතික සංවිධානයක්, නව අන්තර් ජාතික ආර්ථික සංවිධානයක් තරම් වටනේය,' යනුවෙන් කොළඹ සමුළුවේ දේශපාලන ප්‍රකාශනයෙහි සඳහන් වීමෙන්ද එය පෙනේ. ජනමාධ්‍ය මූලික මානව අයිතිවාසිකම් වල දියුණුව සඳහා භාවිත කරනු පිණිස වගකීමෙන් යුතු නැවත් ක්‍රියා මාර්ගයක් අවශ්‍ය වේ. ඒ සඳහා රටක පාලක පක්ෂය එම වගකීම පැහැර නොහැර, එම වගකීමට සහභාගී විය යුතුය.

සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට, ජනසමාජයේ පාලකයන් හට යම් කිසි බලකිරීමක් පෙලඹවීමක් පුවත්පත මගින් කිරීමට ඒකාවට පුළුවන. මෙය ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට ඉතා ප්‍රයෝජනවත් වේ. තවත් විධියකින් කල්පනා කර බලන විට ජනසමාජය ප්‍රගතිය කරා ගෙන යාමට අවශ්‍ය අදහස් දීමට හා පාරම්පරික පිළිවිය ක්‍රමයන්හි වෙනස් ඇති කිරීමටත් පුවත්පතට ශක්තියක් ඇත.

පුවත්පත පසුගිය අවුරුදු පණහ ඇතුළතදී දැඩි වෙනසකට භාජනය වී පවතී. මෙම සියවස පටන් ගැනිමේදී පුවත්පතට තිබුණු කාර්යභාරය අද වෙනස් වෙමින් පවතී. විශේෂයෙන් තුන්වන ලෝකය නමින්, හැඳින්වෙන උසස් සංවර්ධිත රටවල පුවත්පත හා සංවර්ධිත යයි සැලකෙන ධනවාදී රටවල පුවත්පත් අතර විශාල වෙනසක් පවතී. අද ධනවාදී පුවත්පත් වලින් තොරතුරු සැපයීම අඩින් තුන්වන ලෝකයට තර්ජන යක් එල්ල වී ඇති බවද කාරණා වේ. [8]

අප හැම කෙනෙකුටම, සමාන අවකාශ වරප්‍රසාද ලැබිය යුතුය. පුවත්පත වැනි ජනමාධ්‍යයකින් අප වෙත ඉදිරිපත් කරනු ලබන අදහස් වලට පෙරලා අපේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තිබිය යුතුය. එම මාධ්‍යයන් මගින් අප කෙරෙහි දුෂ්ට බලපෑමක් නොකළ යුතුය. ලෝක ජනගහනය අනුව බලන විට ලෝකයේ හැම පුද්ගලයන් 100 ක ගේ අත ගැටෙන්නේ, පුවත්පත් 133 කි. එමෙන්ම ඇතැම් රටවල එකද දිනපතා ජාතික පුවත්පතක් පළ නොවේ. සමහර අප්‍රිකානු රාජ්‍ය ගණනක්, රට ඇතුළත් වන රාජ්‍ය 9 කටම තමන් දිනපතා පුවත්පතක් දක්නටවත් නැත. රටවල් 200 ක් ඇතුළත් කරන ලද සමීක්ෂණ අනුව ලෝක සන්නිවේදන නමැති ග්‍රන්ථයේ නාමිය නිගමනය කරන්නේ දැනට පළවන පුවත්පත් වල අලෙවියද ප්‍රමාණවත් නොවන බවයි. ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික රටවල් ගණනාවක හැම පුද්ගලයන් 50 ක් අතරටම යන්නේ එක් පුවත්පතකි. එසේ වුවත් ජනතාව හා මහජන විජයේ තත්වය මීට වඩා

8. Yojana Vol. XIX No. 23. 1st.January 1976. Western. Press and Devolaping Countries.

වෙනස් වේ. එම රටවල සෑම පුද්ගලයන් හිදෙනෙකුටම එක් පුවත්පතක් බැලීමේ වාසනාව ලැබේ.

සන්නිවේදන ක්ෂේත්‍රයත්, අධ්‍යාපනයත් අතර දැඩි සම්බන්ධතාවක් ඇත.[9] මුළු ජීවිත කාලය තුළම අපට ඉගෙන ගැනීමට දේ ඇත. අධ්‍යාපනයට සන්නිවේදන විධි ඇතුළත් කර ගැනීමෙන් ඇතිවිය හැකි සේවයද මෙතෙකැයි කියා නිම කළ නොහැක. එහෙයින් උගතුන්ගේ අදහස් දක්වන වේදිකාවක් වශයෙන් ද පුවත්පත සැලකීමට පුළුවන. දේශපාලන, ආර්ථික, සාමාජික හා ආගමික මාතෘකා යටතේ ලිපි හා වාද විවාද, ශාස්ත්‍රීය ලිපි, සාහිත්‍ය විවේචන හා කෙසේයුත් ජීවිත කතාද මේවාට ඇතුළත් වේ. එම නිසාම අධ්‍යාපන කටයුතු සඳහා පුවත්පත මහෝපකාරී වන බව පැවසිය හැක.

මීට අමතරව පුවත්පත දෙස සාහිත්‍ය ඇසින් බලන පිරිසක් ද සිටිති. අද බොහෝ දෙනා තුළ පවතින අදහසක් නම්, දවසේ කටයුතු සපුරා ලීම සඳහා කාලය ඉතාමත් මඳ බවයි. එසේ අදහන අයට, ඉතා සුළු වේලාවකදී, ඒ අය බලාපොරොත්තු වන යම් සාහිත්‍ය රසාස්වාදනයක් ලබා ගැනීමටද පුවත්පතක පළවන, කෙටිකතා, කාව්‍ය නාට්‍ය චිරය හා විහිළු තහළු ප්‍රයෝජනවත් වේ.

වෙළඳ භාණ්ඩ තෙමින් තරඟ වාදය පවතින රටවල, ඒ වෙළඳ භාණ්ඩය පතුරුවා හැරීමටත් පුවත්පත ආධාර වේ. පුවත්පතකට ලැබෙන වෙළඳ දැන්වීම්-වලින් ලැබෙන ආදායම මතම, බොහෝ පුවත්පත් රඳා පවතී. ඇමරිකාවේ පුවත්

---

9. Learning to be, the world of Education Today and Tomorow, Unesco Paris 1972. (pp 70-88)